# සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසඞ්ඛාරික සිත සහ සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසඞ්ඛාරික සිත

19.07.20 - ශ්‍රී ලංකාරාමය

නවසීලන්තය

මම මේ පින්වතුන්ට කිව්වා තිබෙන ප්‍රශ්න අද අහන්න කියලා. හොඳයි මහත්මයාගේ ප්‍රශ්නය අහන්න.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස රූපයක් දැකලා චක්ඛු විඤ්ඤාණයක් ඇතිවෙලා රූපය හඳුනා ගන්නවා. එතකොට ඒක නැවත නැවත ඇතිවෙන්න පුළුවන්. ඒ ඒ අවස්ථා වලම ඒ සිතේ කොටස් සම්පූර්ණයෙන්ම නිරුද්ධ වෙලා යනවා. ඊයේ දේශනාවේදී අපි ඇහුවා මනෝ විඤ්ඤාණයක් ඇතිවෙන කොට මුලින් ඇති වෙච්ච සිත් ධම්මාරම්මණ විදියට ක්‍රියාත්මක වෙනවා කියලා. අන්න ඒක පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන් වහන්ස. ඒ සිත් සම්පූර්ණයෙන් නිරුද්ධ වෙලා තිබෙද්දී ධම්මාරම්මණ විදියට ඒ පරණ සිත් එන්නේ කොහොමද කියලා.

පිළිතුර - ඒක වෙන්නේ මෙහෙමයි. අරමුණු ගැනීම සඳහා ද්වාර වශයෙන් තිබෙන්නේ ඔක්කොම 6 යි. ද්වාර වශයෙන් 6 ක් උනහම පළමුවෙන් තිබෙන්නා වූ ද්වාර 5 එක දේකට සීමා වෙනවා. ඒ කියන්නේ චක්ඛුවෙන් හෙවත් ඇහෙන් ග්‍රහණය කරගන්න පුළුවන් වෙන්නේ වර්ණ රූපයක් විතරයි. ඒක නිසා ඒ දොරටුව වර්ණ රූපයට සීමා වෙනවා. ඒක නිසා ඒකට කියනවා **රූපාරම්මණය** කියලා. රූපාරම්මණය ටිකක් ඕලාරිකයි. ඊළඟට තිබෙනවා සද්දය. ඒ සද්දය කනට සීමා වෙනවා. ඒක වෙන කොහේටවත් යැවෙන්නේ නෑ. ඒ තමයි **සද්දාරම්මණය**. ඒවගේ නාසයට **ගන්ධාරම්මණය**, දිවට **රස ආරම්මණය**. කයට අරමුණු තුනක් එනවා. ඒකට **ඵොට්ඨබ්බාරම්මණය** කියලා කිව්වට අරමුණු තුනක් තිබෙනවා. ඒ තුනම එකතු කරලා තමයි ඵොට්ඨබ්බාරම්මණය කියලා කියන්නේ. ඒ තමයි ඇඟට **පඨවි** ගතියත් දැනෙනවා, රස්නේ සීතල වශයෙන් **තේජෝ** ගතිය දැනෙනවා, **වායෝ** ස්වභාවයත් දැනෙනවා. මේ තුනම එකතු කරලා ස්පර්ශය කියලා කියනවා. එතකොට මේ කියන්නා වූ අරමුණු 7 ( 7 ක් කිව්වට අපි 5 යි ගන්නේ) ඒවා තනි කරලා ගත්තොත් **රූපාරම්මණය - සද්දාරම්මණය - ගන්ධාරම්මණය - රසාරම්මණය - ඵොට්ඨබ්බාරම්මණය (පඨවි, තේජෝ, වායෝ)** තමයි ඇස - කන - නාසය - දිව - ශරීරය කියන 5 ට ග්‍රහණය වෙන්නේ.

ඔය හත හැර තව කොච්චර තිබෙනවාද? වර්තමාන වශයෙන් අතීත වශයෙන් අනාගත වශයෙන් බොහෝ දේවල් තිබෙනවා අරමුණු කරන්න. එතකොට හිත පිළිබඳව දැනගන්නත් මොකක් හරි ද්වාරයක් ඕනෑ. ඒක ඇසෙන් කනින් නාසයෙන් දිවෙන් කයෙන් කරන්න බෑ, ඒ පහටම අදාළ වෙන්නේ නෑ. එතකොට සිත කියන එකත් දැන ගන්න ඕනෑ, ප්‍රඥාව ගැන දැනගන්නත් ඕනෑ, අනාගතයේ හරි වර්තමානයේ හරි අතීතයට ගිය එකක් හරි දැනගන්න ඕනෑ, ස්පර්ශය ගැන දැනගන්න ඕනෑ, සියුම් රූප දැනගන්න ඕනෑ. රූප වශයෙන් ගත්තහම ඕලාරික රූප තිබෙනවා 12 ක්, සියුම් රූප තිබෙනවා 16. ඒ සියුම් රූප 16 ම දැන ගන්න ඕනෑ. ඒ හැම එකක්ම අදාළ වෙන්නේ හිතටයි. ඒක නිසා අපි අරමුණු වශයෙන් නම් කරනකොට **රූපාරම්මණය, සද්දාරම්මණය, ගන්ධාරම්මණය, රසාරම්මණය, ඵොට්ඨබ්බාරම්මණය කියලා** බාහිර දොරටු වලට තිබෙන අරමුණු ඒ විදියට නම් කළාට පස්සේ අනිත් තිබෙන සියලු සම්භාරයම එකතු කරලා ලොකු මල්ලක් හදලා අපි කියනවා ඒකට **ධම්මාරම්මණ** කියලා. ධම්මාරම්මණ යටතට හිත, චෛතසික, සියුම් රූප, භාවනා අරමුණු සියලු දේම අයිතියි. අනිත්‍ය දුක්ඛ අනාත්ම කියලා කියන්නේ ධම්මාරම්මණ. අතීත හිත් කියලා කියන්නේ ධම්මාරම්මණ. ඒ හැම දෙයක්ම ධම්මාරම්මණ හැටියට තමයි ගන්නේ.

මම අද මේ පින්වතුන්ට හිත් දෙකක් කියලා දෙනවා. ඒක ඊයේ කියපු කථාවට ඇඳියක්.

- සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත **අසංකාරික** සිත.
- සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත **අසංකාරික** සිත.

සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත **අසංකාරික** සිත කියලා කියන්නේ අකුසල් සිත් 12 පළවෙනි සිත. ඒක ලෝභමූලික සිතක්. ඊයේ අපි කිව්වා ඒක රාග සිතක් කියලා. ලෝභ මූල සිත් 8 තුල තිබෙනවා ලෝභය බලවත්ව වින්දනය කරන හිතක්. මේ සිතේ තිබෙනවා දිට්ඨිගත සම්පයුත්ත භාවයක්. මේ සිත පහළ උනහම මේක හඳුනා ගන්නත් ඕනෑ.

ඔය රාග සිත් කියන ඒවා මොනවගේ සිත්ද කියලා හිතලා බලන්න. අහසේ වලාකුළු තිබෙනවා, අහසේ නිල් පාට තිබෙනවා, වටපිටාවේ අඹ ගස් තිබෙනවා, ගෙවල් දොරවල් තිබෙනවා, සතා සිව්පාවා ඉන්නවා, මනුස්සයෝ ඉන්නවා. මේ ඔක්කෝම අරමුණු. මේ අරමුණු අපි බෙදාගන්න ඕනෑ, ඒ අරමුණු සජීවි ආරම්මණ සහ අජීවී ආරම්මණ වශයෙන් වර්ග කරගන්න ඕනෑ. සත්ව සංඛාවට ගැනෙන සහ සත්ව සංඛාවට ගැනෙන්නේ නැති ආරම්මණ තිබෙනවා.

මනුස්සයෙකුට පේනවා මගා ගල් පර්වතයක්, ඒ මනුස්සයා ඒ ගල් කන්දට ලෝභ කර කර ඉන්නවා. තව පුරුෂයෙක් ලස්සන කාන්තාවක් ගැන හිත හිතා ඉන්නවා. තවත් කාන්තාවක් ඉන්නවා handsome පුරුෂයෙක් ගැන හිත හිත. තවත් කෙනෙක් ඉන්නවා එයා අඹ ගහට ලෝභ කරමින් ඉන්නවා, මේ ඔක්කොම අරමුණු. ගල් කන්දක්, අඹ ගහක්, පුරුෂයෙක්, ස්ත්‍රියක් යන මේවා තමයි අරමුණු. දැන් මේ හතර දෙනෙක් ස්ථාන හතරක හිතන්නේ. මේ ස්ථාන හතර ගැන හිතනකොට හොඳට හිතලා බලන්න මේ හතර දෙනාගෙන් බරපතල විදියට රාගය හැදෙන්නේ අඹ ගහටද ගල් කන්දටද කාන්තාවටද පිරිමියාටද? බරපතල විදියට රාගය හැදෙන්නේ කාන්තාව සහ පුරුෂයා කියන අරමුණු වලට. ඒකට හේතුව ඒවා ජීවී ආරම්මණ නිසා. අනිත් ඒවාට ලෝභය තිබුණාට සත්ව ආරම්මණ වලට හිත යනවා වගේ අනිත් අරමුණු වලට හිත යන්නේ නෑ. ඒවගේම තමයි තරහ ඇතිවන කොටත් තරහ ඇති වෙන්නේ සත්ව ආරම්මණයටයි. මාන්නයත් එහෙමයි, ගල් කන්ද සමග සම කරලා මාන්නයක් හදා ගන්නේ නෑ. ඒවගේම අඹ ගස් ගැන හිතලා තමන් හා සම කරලා මාන්නයක් හදාගන්නෙත් නෑ. එතකොට මාන්නය හදාගන්නත් වැඩියෙන් ආධාර වෙන්නේ පුද්ගල ආරම්මණය. මේ අරමුණු අතර වින්දනාත්මක රාග සිතක් හැදෙන්නේ කාන්තාවට හෝ පුරුෂයාට. ඒකට හේතුව, ප්‍රාණියෙක් හැටියට සළකන ගතියක් තිබෙන නිසා.

කෙනෙක් පිළිබඳව ලෝභයක් හැදුනහම ඒ කෙනා පිළිබඳව හිත හිතා ලෝභ කරනවා, හිතෙන් විඳ විඳ ඉන්නවා. ඒක කරන්නේ සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංකාරික සිතින්. ඇයි ඒ සිත් අසංකාරික වෙන්නේ? ඒ සිත අසංකාරික වෙන්නේ වෙන කවුරුවත් කියන්නේ නෑ 'මේ විදියට හිතන්න මේ විදියට හිතන්න' කියලා. තමන්ම තමයි හිතන්නේ, තමන්ම තමයි අදහස මතුකරලා ගන්නේ. ඒක නිසා ඒක අසංකාරිකයි. ඒ නිසා තමන්ටම ඇති වෙන්නා වූ රාග සිත් අසංකාරිකයි. සමහර වෙලාවට පමණක් සසංකාරික වෙන්න පුළුවන් ගතිය තිබෙනවා. ඒකත් අපි බලමු.

මේ අසංකාරික රාග සිතුවිලි තද බල විදියට එනවා. අපි එකක් කියලා කිව්වට එවැනි සිත් එකක් නොවෙයි පහළ වෙන්නේ. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංකාරික සිත්වැලට එනවා. කෙනෙක් ඇස් දෙක පියාගෙන කාන්තාවක් ගැන හරි පිරිමියෙක් ගැන හරි හිත හිතා ඉන්නවා. එතකොට මේ සිත් දිගටම පහළ වෙනවා. ඒ සිත් වල තිබෙන සෝමනස්ස ගතිය විඳ විඳ ඉන්නවා. ඒ සිතේ තිබෙනවා දිට්ඨිගත සම්පයුත්ත භාවය. දිට්ඨිගත සම්පයුත්තයි කියලා කියන්නේ එයා අරමුණුකරන කාන්තාව හෝ ඒ පුද්ගලයා ගැන තමන්ට හිතෙන්නේ යම්කිසි පුද්ගලයෙක් හෝ

ස්ත්‍රියක් කියලා. නමුත් ඒ  පුරුෂයෙක් හෝ ස්ත්‍රියක් හෝ කියලා කියන තැන තිබෙන්නේ වෙන මොකක්වත් නොවෙයි, එතැන තිබෙන්නේ රූප ගතියක්, වේදනා ස්වභාවයක්, සංඥාවක් එකතු වෙච්ච තැනක්, සංස්කාරයක්, විඤ්ඤාණ සංකලනයක්. සකන්ධ වශයෙන් ගත්තහම එතැන තිබෙන්නේ පංච ස්කන්ධ ගුලියක්. එතැන තිබෙන්නේ නාම ධර්ම රූප ධර්ම ටිකක්. 'මෙයා හොඳ කාන්තාවක්, මෙයා හොඳ පුරුෂයෙක්' කියලා සත්ව සංඥාවක් ඒකෙ කාවද්දලා තිබෙනවා. ඒකට කියනවා දිට්ඨිගත වෙනවා කියලා. සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් කෙනෙක් හැටියට සලකාගන්න ගතියට කියනවා දිට්ඨිගත වෙනවා කියලා. සෝමනස්ස වෙන්නේ ඒ මනුස්සගේ මූණ නළල අතපය හොඳයි කියලා හිතුවොත් තමයි.

පුරුෂයෙක්  කාන්තාවගේ කෙස්වල  වර්ණය ගැන ඇස් ගැන හොඳයි කියලා හිතනවා. එයා ඒ 'ඇස්' තනි කරලා ගන්නේ නෑ. එයා ගන්නේ මේ අහවල් කෙනාගේ ඇස් කියලා. හැම වෙලාවේම දිට්ඨියට බද්ධ කරලා හිතන්නේ. හැම වෙලාවේම  පුද්ගල සංඥාවක්  පුද්ගල සංකල්පයක් කාවැදිලා තිබෙනවා. පුද්ගල සංකල්පය හදා ගන්නේ නැතුව  ඒ රාගී ගතිය ගන්න බෑ. ඒක අවශ්‍යයමයි. 'මේ මනුස්සයා හරිම හොඳයි' කියලා ඒකට කරුණු එක්කාසු කර කර එයා ජීවත්වන තැන හිතනවා, ජීවත්වන ස්ථානය, ගෙදර දොර, එයා හමුවූ තැන, ගමන බිමන, කථා කරපු දේවල් ආදී හැම දෙයක්ම මේ **සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංකාරික සිතින්** හිත හිතා, හිත හිතා වින්දනය කරනවා. මේ විදියට විඳින්න විඳින්න සෝමනස්ස සහගත ගතිය (සැප වේදනාව) සිතේ ඇතිල්ලී ඇතිල්ලී තිබෙනවා. ඒ සැප වේදනාව විඳින්න සිත කැමතියි. ඒ සැප වේදනාවත් එක්ක තනි වෙන්න හිත කැමතියි. ඒකට කියනවා සිහින ලෝකය කියලා. පුරුෂයෝ කාන්තාවන් ගැනත් කාන්තාවෝ පුරුෂයන් ගැනත් ඔය විදියට සංකල්ප කරනවා. මම ඒ **සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංකාරික**  හිත රතු පාටින් ලිව්වේ ඒ සිත හරි අනතුරු දායක නිසයි.  මේක  හරිම බලවත් අකුසල් සිතක්.

මම  ඊයේ  කිව්වා හිතට මේ  විදියටයි  ලෝභ ආරම්මණයක් එන්නේ, ඒ අරමුණ ආවහම ඒ ගැන තනිවෙනවා, හුදකලා වෙනවා කියලා. එතකොට ඒ හිත **සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංකාරික සිතක්** කියලා හඳුනා ගන්න ඕනෑ. මේ සිතේ සෝමනස්ස ගතිය තිබෙනවා. නැත්නම් විඳින්න බෑ. උපේක්ෂා සහගත සිතකින් අරමුණක් අරමුණු කරන්න පුළුවන් නමුත් විඳින්න බෑ. රාගයට තිබෙන්න ඕනෑ රසයක්.

අපි හිතමු කාන්තාවක් පිරිමියෙක් ගැන හිතනවා උපේක්ෂා සහගත සිතකින්. ඒ මනුස්සයා ක්‍රිකට් ගහන්නත් කැමතියි, ඒ මනුස්සයාට දුවන්නත්  පුළුවන් කියලා උපේක්ෂා සහගත සිතකින් සිතනවා. ඒ කාන්තාව  ඒ පිරිමියා ගැන ඒ විදියට හිතන හිතේ ලෝභ සහගත ගතිය තිබෙනවා නමුත් විඳීමේ තිබෙන්නේ ඇල්වතුර ගතියක්. ඇල් වතුරවල කිසිම රසක් නෑ. ඒකෙ තිබෙන්නේ මධ්‍යස්ථ ගතියක්.
මේ තමයි ලෝභ සහගත සිතක් උපේක්ෂා සහගතවන අවස්ථාව.

*උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත **සසංකාරික** සිත = මේ සිතේ වේදනාව උපේක්ෂා සහගතයි. ඒවගේම  ඒ සිත දිට්ඨිගත සම්පයුත්තයි,  සසංකාරිකයි.

එක ගෙදරක ඉන්නවා අවුරුදු 35 ක් විතර වයස ගිය දී ගන්න බැරි වෙච්ච ගෑණු ළමයෙක්. ඒ ගෑණු ළමයාට දෙමව්පියෝ විවාහයක් යෝජනා කරනවා. මේ ගැන හොඳට හිතලා බලන්න. 'කල්පනා කරලා බලපන් උඹටත් යන කල දසාවක් තිබෙන්න ඕනෑ' කියලා දෙමව්පියෝ ඒ ළමයාට යෝජනා කරන ක්‍රමයක් ශ්‍රී ලාංකික සමාජයේ තිබෙනවා. ඒ උනාට ඒ ගැහැණු ළමයට විවාහ වෙන්න කියලා ඒ තරම්ම හැඟීමක් නෑ. අම්මල මේ ළමයාට ගරාජ් එකක වැඩ කරන මනුස්සයෙක් පිළිබඳ යෝජනාවක් ගේනවා. එයා ඉතිං ඒක අහගෙන  ඉන්නවා,  එච්චර උවමනාවක් නෑ  නමුත් අම්මලට එපා කියන්නෙත් නෑ,  ඒ

තරම්ම උද්යෝගා හිතක් එයාට නෑ. ඒ යෝජනා කරපු මනුස්සයා හොඳයි කියලා හිතෙන්නෙත් නෑ. එතකොට ඇතිවෙන මානසික වේදනාව තමයි උපේක්ෂා වේදනාව. ඒ සිතේ දිට්ඨිගත සම්පයුත්ත ස්වභාවයත් තිබෙනවා. ඒ යෝජනා කරපු මනුස්සයා පිළිබඳව එයාට ඇතිවෙනවා සත්ව සංඥාව. එහෙම උනත් එයාට ඇතිවෙන්නේ ඒ මනුස්සයා පිළිබඳ ඇල්වතුර වැනි හැඟීමක්, උපේක්ෂා සහගත සිතක් පහළ වෙන්නේ. ඒ සිත උපේක්ඛා සහගතයි දිට්ඨිගත සම්පයුත්තයි.

ඇයි මේ සිත සසංකාරික උනේ? එහෙම උනේ දෙමව්පියෝ තමයි ඒ කාන්තාවට ඒ මනුස්සයාට තිබෙන ඉඩ කඩම් ගැන කියලා වටිනා කමක් දීලා ඒ කාන්තාවගේ හිත උද්‍යෝගවත් කළේ. එහෙම උනහම ඒ සිත උපේක්ඛා සහගතයි දිට්ඨිගත සම්පයුත්තයි, සසංකාරිකයි. සසංකාරික වෙන්නේ දෙමව්පියන් ඒ කාන්තාවගේ හිත අවුස්සලා ලෝභය මතු කරලා දෙන නිසා නමුත් ඒ කාන්තාවට තිබෙන්නේ අපි tofu කනකොට තිබෙන රස. tofu රස කියලා කිව්වේ ඒක නරකත් නෑ, රසකුත් නෑ.

දැන් නැවතත් හිතන්න සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත **අසංකාරික** සිත ගැන. ගැහැණු ළමයෙක් ඉස්කෝලේ යනකොට යාලු කරගන්නවා ප්‍රසන්න කියලා තරුණයෙක්. ඒ ගැහැණු ළමයාට ඒ පිරිමි ළමයා හරි හොඳයි. ඒ ළමයගේ නමත් ප්‍රසන්න ඒ වගේම හිතට දැනෙන්නෙත් ප්‍රසන්න ආකාරයට. නමුත් ඒ ගැහැණු ළමයාගේ දෙමව්පියන්නට එයා අප්‍රසන්නයි. ඒ උනත් ඒ ගැහැණු ළමයා ඒ ගැනම හිත හිතා ඉන්නවා. අම්මලා අකමැති උනත් ඒ ළමයා කරන්නේ ප්‍රසන්න ගැන හිත හිතා ඉන්න එක. එතකොට පහළ වෙන්නේ සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත **අසංකාරික** සිත. එහෙම වෙන්න හේතුව පුද්ගල ඇඳියක් පුද්ගල සංඥාවක් ප්‍රඥප්තියක් හොඳට හිතේ වද්දගෙන තිබෙන නිසා. ඒ මනුස්සයා හොඳයි දක්ෂයි ප්‍රියමනාපයි කියලා හිතනවා. ඒ තමයි සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත **අසංකාරික** සිත.

උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත **සසංකාරික** සිත තිබෙන එක්කෙනාටත් රාග සිතක් තිබෙනවා. නමුත් සෝමනස්ස සහගත සිත තිබෙන කෙනාට තරම් සැරට නෑ. අපි හිතමු සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත **අසංකාරික** සිත තිබෙන ළමයාට දෙමව්පියන් තරවටු කරනවා. එයා කලකිරිලා යනවා ස්වාමීන් වහන්සේ නමක් හම්බවෙන්න. එතකොට ඒ ස්වාමීන් වහන්සේ එයාට කියලා දෙනවා සත්වයා කියන්නේ කවුද, අම්මා තාත්තා කියන්නේ කවුද, ප්‍රසන්න කියලා කියන්නේ කවුද සිත් සහ චෛතසික කියලා කියන්නේ මොනවාද කියලා. ඒ ගැහැණු ළමයාට ප්‍රසන්න කියන තරුණයා ගැන හිත හිතා ඉන්නකොට ඇතිවන සිතුවිල්ල දෙස බලන්න ඒ ස්වාමීන්වහන්සේ කියලා දෙනවා. එයා ඊළඟට ඒ අනුසාරයෙන් ප්‍රසන්න ගැන හිතන 'හිත' දෙස බලනවා.

එයාට ප්‍රසන්න ගැන ලෝභ සිත් පහළ වෙනවා. ඒ ළමයා ප්‍රසන්නව අරමුණු කරනවා, එයාගේ ලස්සන හිතනවා, හැඩහුරුකම හිතනවා. දැන් ඒ ගැහැණු ළමයා ස්වාමීන්වහන්සේ කියලා දීපු විදියට 'මට සෝමනස්ස ගතියක් තිබෙනවා, රාගී ගතියක් තිබෙනවා, මට ආසා ගතියක් තිබෙනවා, මේ අරමුණ පුද්ගලයෙක් හැටියට ගත්තු ගතියක් තිබෙනවා' කියලා ඒ සිත ගැන හිතනවා. එයාට දැන් ඒ හිතේ ගතිය තේරෙනවා. ඒ වෙලාවට ඒ ගැහැණු ළමයාගේ හිතේ පහළ වෙන්නේ සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත **අසංකාරික** සිතක්. මේ අවස්ථාවේදී එයාට ඉස්සෙල්ලා පහළ උන ලෝභ සිත හොඳට මෙනෙහි වෙනවා. ඒ හිත හොඳට හසු වෙනවා. ආරම්මණය ගැන තේරෙනවා. ඒ මෙනෙහි කරන කුසල සිතේ **සෝමනස්ස සහගත** භාවය හොඳට තිබෙනවා. එහි ඤාණ සම්පයුත්ත භාවය කියලා කියන්නේ එයා ඒ ගැන හොඳට හිතනවා, හිත හොඳට bright.

'ප්‍රසන්න කියලා කියන්නේ රූප ගොඩක්, වේදනාවක්, සංඥාවක්, නාම රූප ගොඩක්, මගේ හිත ඒ වගේ දෙයක් ගැන තමයි හිතුවේ' කියලා එයාට පහළ වූ ලෝභසිත ගැන, ඒ ආරම්මණය ගැන එයා මෙනෙහි

කරනවා. එයා හිතනවා 'එතැන තිබෙන පඨවි ධාතුව, ආපෝ ධාතුව, තේජෝ ධාතුව, වායෝ ධාතුව තමයි මට ප්‍රසන්න හැටියට පෙනුණේ' කියලා. ඒ ගැන තේරෙන කොට ලොකු සතුටක් ඇතිවෙනවා. ඊට පස්සේ එයා රූප - වේදනා - සංඥා - සංඛාර - විඤ්ඤාණ කියලා ස්කන්ධ වශයෙන් හිතනවා. එහෙමත් නැත්නම් නාම - රූප ධර්ම වශයෙන් බලනවා. නැත්නම් ධාතු ස්වභාව වශයෙන් හිතනවා.

ප්‍රශ්නය - ස්වාමීන් වහන්ස පිළිකුල ගැන මෙනෙහි කරනකොට කොහොමද සෝමනස්ස සහගත සිත් පහළ වෙන්නේ?

පිළිතුර - පිළිකුල ගැන හිතනකොට ඉස්සෙල්ලා පහළ වෙන්නේ උපේක්ෂාව. **උපේක්ෂා** සහගත ඤාණ සම්පයුත්ත **අසංකාරික** සිත. නමුත් මෙනෙහි කිරීම බලවත් වෙනකොට පහළ වෙන්නේ **සෝමනස්ස** සහගත ඤාණ සම්පයුත්ත **අසංකාරික** සිත.

ප්‍රශ්නය - ස්වාමීන් වහන්ස දැන් ඔය සෝමනස්ස සහගත සිත් පහළ වෙන්නේ ප්‍රසන්න කියන පුද්ගලයා ගැන හිතනකොට නොවෙයි නේද?

පිළිතුර - හොඳට හිතන්න. ප්‍රසන්න කියන පුද්ගලයා ගැන හිතනකොට සෝමනස්සය ඇතිවෙනවා නම් එතැන තිබෙන්නේ පුද්ගල සංඥාව. දිට්ඨිය. එතකොට ඒ සිත දිට්ඨි ගතයි. ඉස්සෙල්ලා ප්‍රසන්න හැටියට, පුද්ගලයෙක් හැටියට බලපු කෙනා දැන් ධර්ම වශයෙන් බලනකොට ඇත්ත තේරෙනකොට තමයි සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංකාරික සිත් පහළ වෙන්නේ.

ඊළඟට බලමු අර අම්මලා විවාහයක් යෝජනා කළ උපේක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත **සසංකාරික** සිත් පහළ වූ කාන්තාව ගැන. එයාට අම්මලා ගෙනාපු යෝජනාවට බෑ කියන්නත් බෑ, ඒ ගැන කැමැත්තකුත් නෑ. ඒක නිසා එයත් යනවා ස්වාමීන්වහන්සේ කෙනෙක් මුණ ගැහිලා විවාහ වෙන්න තිබෙන අකමැත්ත ප්‍රකාශ කරලා හිත පහදවා ගැනීමට අවවාදයක් ලබා ගන්න. නියම ධර්මය කියලා දෙන ස්වාමීන්වහන්සේලා හැටියට ඒ ස්වාමීන්වහන්සේ ස්කන්ධ ධාතු ආයතන ඉන්ද්‍රිය පටිච්චසමුප්පාද වශයෙන් ධර්මය බලන හැටි කියලා දෙනවා. එතකොට ඒ කාන්තාවට තේරෙනවා ඇත්ත තත්වය ඒකයි කියලා. ඒ අවස්ථාවේදී ඒ කාන්තාවට ස්වාමීන්වහන්සේ කියපු නිසා මුලින් ඇති වෙන්න පුළුවන් **උපේක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංකාරික සිත්.** නමුත් පසුව තමන්ම මෙනෙහි කරමින් යනකොට **උපේක්ඛා සහගත ඤාණ සම්පයුත්ත** අසංකාරික **සිත් ඇතිවෙනවා.**

අනිත් එක තමයි, 'මම හිතුවා හරි, හාමුදුරුවෝ කියන්නෙත් ඒකමයි, සත්වයෙක් කියලා මම හිතුවට එතැන තිබෙන්නෙත් නාම රූප දෙකක්, පඨවි ආපෝ තෙජෝ වායෝ කියන ධර්ම කට්ටලයක්, ආයතන ධර්ම සමූහයක්' කියලා ඒ ධර්මය ගැන මෙනෙහි වෙනකොට හරි සන්තෝසයක් ඇති වෙනවා. එතකොට පහළ වෙන්නේ සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංකාරික සිත.

දැන් බලන්න, ඉස්සෙල්ලා පහළ වූ, අරමුණ වින්දනය කරන සිතට කියන්නේ රාග සිත කියලා. ඊළඟ ධර්ම අනුසාසනාවකින් මග පෙන්වීමකින් ඒ රාගී සිත දෙස බලන්න ස්වාමීන්වහන්සේ කියලා දෙනවා. ඒ සිත බලන්න කියලා දීලා ඒ සිත දෙස බලනකොට ඇතිවෙන්නේ **සෝමනස්ස සහගත** හරි **උපේක්ෂා සහගත** හරි ඤාණ සම්ප්‍රයුත්ත සිතක්. ඒ සිත සසංකාරික හෝ අසංකාරික වෙන්න පුළුවන්.

**උපේක්ඛා සහගත ඤාණ සම්පයුත්ත සසංකාරික සිතක් හරි සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංකාරික සිතක්** හරි පහළ වෙන්නේ **අකුසලයක්** අරමුණු කරගෙන. මෙන්න මේ සිද්ධියට කියනවා අකුසලා ධම්මා හේතු පච්චයෝ කුසලා ධම්මා කියලා = අකුසල ධර්මයෝ හේතු ප්‍රත්‍යය වෙනවා කුසල


ධර්මයන්ට. දැන් මේ කුසල ධර්මය පහළ උනේ අකුසල ධර්මයක් නිසා. මේ විදියට අකුසල ධර්මයකින් කුසල ධර්මයක් ඇතිකර ගන්න පුළුවන්. ඒකට කියනවා අකුසලා ධම්මා හේතු පච්චයෝ කුසලා ධම්මා කියලා.

ඔය විදියට මෙනෙහි කරගෙන යනකොට අපි කියනවා 'මේ විදියට මේ විදියට ආරම්මණය දෙස බලන්න' කියලා. ටික වෙලාවක් යනකොට සංසාරයේ පුරුදු රාගී අරමුණු මතුවෙනවා. මම ඊයේ කිව්වා නේද හැම එකෙනාගේම හිත් පුරුද්දට හරි රහ නිසා හරි යම් යම් තැන් වල ගැවසෙනවා කියලා. සිත ඒ චරිත එක්ක, ඒ මනෝමය පින්තූර එක්ක සහ සම්බන්ධ වෙලා බන්ධනය වෙලා හුදකලාව ඒවත් එක්ක ගනුදෙනු කර කර ඒවා රස විදිමින් ඉන්න ගතියක් තිබෙනවා. මේ ධර්ම කාණ්ඩය හිතට පොඩ්ඩක් මතක් කරලා හිතට පොඩ්ඩක් හසුකරලා දීලා එයාට තමන් හිත හිත ඉන්නේ මොකක්ද කියලා හිතන්න හිතුවිල්ලක් හදලා දුන්නා නම් එයා ඒකට පැන ගන්නවා. එතකොට ඒ අලුතින් කියලා දීපු විදියට තමන් රස කරමින් හිත හිතා හිටපු සිතුවිල්ල ගැන අලුතෙන් හිතන්න පෙළඹෙනවා. එතකොට ඇති වෙන්නේ කුසල සිතක්. ඒ කුසල සිත් දිගට දිගට ඇවිල්ලා ඉස්සෙල්ලා පහළ වෙච්ච අකුසල් ආරම්මණය මෙනෙහි කරමින් මෙනෙහි කරමින් ඉන්නවා. එතකොට ඒ සිත **ඥාණ සම්ප්‍රයුක්ත** භාවයට පත්වෙනවා.

ඒ **ඥාණ සම්ප්‍රයුක්ත** භාවයට පත්වෙනකොට මොකක්ද එතැන තිබෙන්නේ?

දැන් හොඳට බලන්න. **සෝමනස්ස සහගත ඥාණ සම්පයුත්ත අසංකාරික සිත** කියලා කිව්වා. මේ අසංකාරික සිතේ **ඥාණ සම්පයුත්ත** භාවය කියලා තිබෙනවා **ප්‍රඥා චෛතසිකය**. නමුත් ප්‍රඥාව විතරක් නොවෙයි තිබෙන්නේ. එතැන ප්‍රඥාවත් සමග **සතියත්** තිබෙනවා. ඒ විතරක් මදි. ඒ සිතට වීර්යත් අවශ්‍යයි. තවත් මේ සිතේ තිබෙනවා ප්‍රීතිමත් ගතිය. දැන් එතකොට මෙතන ධර්මතා හතරක් තිබෙනවා. මේ සිතුවිල්ලෙ අඩුවෙන් හරි වැඩියෙන් හරි තිබෙනවා සැහැල්ලු ගතියක්.

විවාහකයක් ගැන කථා කරනවා කියලා කියන්නේ බොහෝ අයට හරි බරක්. ඒක වග කීමක්. පන්සල සේනාසනය යෝගාශ්‍රමය ආශ්‍රය කරගෙන ඉන්නකොට ඒ බර අයින් කරන්න පුළුවන්. එතකොට හිතට ඇතිවෙනවා සැහැල්ලුවක්. ඒකට කියනවා **පස්සද්ධිය** කියලා. තවත් මේ සිතේ තිබෙනවා ඒකාග්‍රතාවය කියලා ඒ අරමුණ මෙනෙහි කරන්න හිත එකතැන් කරලා දෙන ගතියක්. ඒකට කියනවා **සමාධි** කියලා.



මේ සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංකාරික සිත **සමග ඇතිවන සතිය, පඤ්ඤාව, විරිය, ප්‍රීතිය, පස්සද්ධිය, සමාධිය** යන මේ ඔක්කෝම ධර්ම සමග තවත් ඒ සිතේ තිබෙන සංකලන සියල්ලම එක ගානට සමව දුවවන්න අවශ්‍යය, මේ ධර්මතා සියල්ල සමලෙස පවත්වන ගතියට (balance කරන ගතියට) කියනවා **උපේක්ෂා** ගතිය කියලා. මෙතැන ධර්මතා 7 ක් තිබෙනවා. දැන් බලන්න, එක තැනක් මෙනෙහි කරනකොට ධර්ම කාරණා 7 ක් වැඩෙනවා. ඒ ටික ඔක්කොම මේ සිත ඇතුලේ තිබෙනවා.

එක දවසක් මම දැක්කා අම්මා කෙනෙක් උයනවා. එතැන තිබුණා මැස්සක් ගහලා. ඒ මැස්සේ තිබුණා දර වගයක්. එතැන පොඩි හට්ටියකුත් එල්ලලා තිබුණා. තව පුවක් කොලයකින් හදපු පැණි මුලකුත් එල්ලලා තිබුණා. ඒ උයන භාජනය උඩ තවත් බොකුටු භාජනයක වතුර තිබුණා. ඒ අම්මාගේ ප්‍රධාන කාරිය තමයි ඉවීම. ගින්දර දාලා කෑම උයනකොට වැඩ කටයුතු කීපයක්ම එකසැරේට සිද්ධ වෙනවා. බතක් හරි මොකක් හරි උයනවානම් බත ඉවීම, ඒ ආශ්‍රයෙන් වතුර එක රත් වීම, දර ටික වේලීම, උඩ එල්ලලා තිබුණ භාජනයේ තිබුණ මිරිස් වේලීම, අනිත් එක තමයි පැණි මුල. එතැන කාරණා 5ක් ම එකවිට සිදු වෙනවා.

අන්න ඒ වගේ සිතක් 'කුසල සහගත' කරනකොට ඒක අස්සේ වැඩෙන්නා වූ ධර්ම ඔන්න ඔය විදියට තමයි බලන්නේ. මෙතැන කුසල ධර්ම 7 ක් වැඩෙනවා. ඒක නිසා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා එක ආනාපානසති ආරම්මණයක බොජ්ඣංග ධර්ම වැඩෙන්නේ කොහොමද කියලා. එක හුස්ම රැල්ලක් සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත අසංකාරික සිතෙන් මෙනෙහි කරකොට ඒ තුල **ප්‍රඥා** චෛතසික තිබෙනවා, **සිහිය** තිබෙනවා, **විරිය** තිබෙනවා, ප්‍රීතිමත් ගතිය තිබෙනවා, **පස්සද්ධි** ගුණය තිබෙනවා, **සමාධි** ගුණය තිබෙනවා වගේම **උපේක්ෂා** ස්වභාවයත් තිබෙනවා. මේ ටික ඔක්කෝම ලස්සනට වැඩෙනවා. ඒවගේම හොඳට හිත එකතැන් කරගෙන හොඳ ඕනෑකමින් ශ්‍රද්ධාවෙන් බැසගෙන ධර්ම දේශනාවක් අහනවානම් මේ ධර්ම 7 ම වැඩෙනවා. මේ වැඩෙන්නේ **සප්ත බොජ්ඣංග** ධර්ම. බණ අහන වෙලාවට මිනිස්සු ධර්මය අවබෝධය කරගත්තේ ඔය සිද්ධිය ඇතුලාන්තයේ සිද්ධ වෙච්ච හින්දයි.

ඇලීම නැතුව, බැඳීම නැතුව, රාගය නැතුව, ලෝභය තණ්හාව නැතුව ඒවා පටලවා ගන්නේ නැතුව ඒ ධර්ම හොඳට දකින්න මෙනෙහි කරන්න අපි හිත පුරුදු කරන්න ඕනෑ.

ප්‍රශ්නය - ස්වාමීන් වහන්ස තත්‍රමජ්ඣත්තතාව කියන්නේ මොකක්ද?

පිළිතුර - තත්‍රමජ්ඣත්තතාවය කියන්නේ චෛතසිකයක්. ඒක මෙහෙමයි තිබෙන්නේ. ප්ලේන් එකක් නග්ගනකොට මම අහලා තිබෙනවා බර සම කරනවා කියලා එකක්. පියාසර කරන්න යනකොට ඒකට අවශ්‍ය බර සම කිරීමක් තිබෙනවා. ඒ ගැන මම දැනගත්තු ටිකක් කියලා දෙන්නම්. පොළවේ වායු පීඩනය වැඩියි. අඩි 42,000 විතර උඩින් යනකොට වායු පීඩනය අඩුයි. අපි වැඩි වායු පීඩනයක හිටපු අය නිසා උඩට යනකොට ප්ලේන් එක ඇතුලේ තිබෙන පීඩනය පොළවට සමවෙන්න තිබෙන්න ඕනෑ. අන්න ඒ පීඩනය සමකර ගන්නවා වගේ එකක් තමයි තත්‍රමජ්ඣත්තතාවයෙන් කරන්නේ. සිතේ තිබෙන සියලුම ධර්මතාවයක් සමව පවත්වාගෙන යන ගුණ ස්වභාවයක් තිබෙනවා. ඒක චෛතසිකයක්. ඒකට කියනවා තත්‍රමජ්ඣත්තතාවය කියලා.

ප්‍රශ්නය - 'තණ්හා' 'රති' 'රගා' කියලා කියන තැන 'රති' කියලා කියන්නේ මොකක්ද ස්වාමීන් වහන්ස?

පිළිතුර - 'තණ්හා' 'රති' 'රගා' කියලා කියන්නේ කෙලෙස්. නමුත් ඒ වගේ මිනිස්සුන්ට දාපු කෙලෙස් නම් තිබෙනවා. රංජනී කියලා නමක් තිබෙනවා. හිතලා බලන්න ඒ මොකක්ද කියලා. තව තිබෙනවා කාමිනී කියලා නමක්. කාමිනී කියන්නේ කාමයට තිබෙන බරපතල කැමැත්ත. රංජිත් කියලා තිබෙනවා. රංජන කියලා තිබෙනවා. මිනිස්සු මොකක් හරි හැඩට තිබෙන ශබ්දයක් නමක් හැටියට පාවිච්චි කරනවා හැර යථාර්තය ගැන හිතන්නේ නෑ. රංජන කියන්නේ විඳිනවා සතුටු කරනවා කියන එකයි.

මහත්මයෙක් - ඉස්සරහට මිනිස්සු ගන්නේ ධර්මයේ තිබෙන අර්ථ නොවෙයි වෙන වෙන දේවල්. ඒක හරි භයානකයි.

ස්වාමීන්වහන්සේ - ඒක හරි බරපතකයි. තථාගතයන් වහන්සේත් එය දේශනා කළා. ධර්මයේ තිබෙන වචන ටික එක්කාසු කරගෙන සමහර අය ඒ අයගේ දෘෂ්ඨී ඒ වචන වල පැකට් කරලා බෙදලා දෙන එකක් දැන් තිබෙන්නේ. ඒක නිසා අපි බොහෝම අප්‍රමාදීව කටයුතු කරගන්න ඕනෑ. ඒ අයගේ ආශ්‍රයෙන් මුලාවෙන් දෘෂ්ඨී කාරයන්ගෙන් ඈත්වෙලා, අසත්පුරුෂ සිත් තිබෙන නමුත් සත්පුරුෂයෝ හැටියට ගැවසෙන සත්පුරුෂයෝ හැටියට හඬ දදා අසත්පුරුෂ වැඩ කරන්නා වූ, පාපීම වැඩ කරන්නා වූ අයගෙන් අයින්වෙලා මිදිලා යන්න අපි මහන්සි ගන්න ඕනෑ.

කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ කාලයේදී සංවර භික්ෂුවට, සංවර උපාසක උපාසිකාවන්ට කථා කරන්න හරි අමාරු උනා. කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ කාලයේදී කටකාරයෝ විනය ශික්ෂාපද පිළිබඳ එක එක ඒවා කියලා මිනිස්සුන්ව පෙළඹුවා. සිල්වන්ත ගුණවන්ත අයට, ධර්මය රැකපු අයට ඉඩක් අවස්ථාවක් හම්බ උනේ නෑ. අසංවර කෙනාට සීලයක් නැති කෙනාට රකින්න දෙයක් නෑ. එයා හිතෙන හිතෙන දේවල් කියනවා. ඒක තමයි ස්වභාවය. නමුත් ඒවගේම තමයි ප්‍රතිඵලයත්.

එක භික්ෂුන් වහන්සේ කෙනෙක් හිටියා කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ සාසනයේ ධර්මය විනාස කරන්න ධර්මය අවතක්සේරු කරන්න පෙරටුගාමී උන. එයා lead කරනවා, අනිත් අය එයාගේ පිටිපස්සේ යනවා. ඒ lead කරපු එක්කෙනා අපායේ ගියා. එයාගේ නම කපිල. එයාගේ සහෝදරයෙක් හිටියා, සහෝදරයා බේරුනා. අම්මා හිටියා, අම්මත් අපායේ ගියා. සහෝදරියක් හිටියා එයත් අපායේ ගියා. ඒකට උල්පන්දම් දීපු ඔක්කොම ටික නරකාදියට ගියා. කවුරුවත් නිවන් ගියේ නෑ. ඊට පස්සේ ගෞතම බුදුරජාණන්වහන්සේ වැඩ ඉන්න කාලයේදී කපිල කියලා මාලුවෙක් උනා. ඒවගේ දේවල් සිද්ධ වෙනවා.

බුදුරජාණන්වහන්සේත් දේශනා කරනවා බේර ගන්න පුළුවන් අය බේර ගන්න කියලා. අනිත් අය බේර ගන්න කියලා අපිට වගකීම ගන්න බෑ. බුදුරජාණන්වහන්සේගේ නෑදැයෙක් හිටියා යසෝදරා දේවීන් වහන්සේගේ තාත්තා. සුප්‍රබුද්ධ රජ්ජුරුවෝ. සුප්පබුද්ධ කියලා කියන්නේ ප්‍රසන්නව අවදි වෙනවා කියන එකයි. ඒ උනාට ඒ රජ්ජුරුවෝ ගියේ අපායට. බෑණා ලොව්තුරා බුදුවෙලා, මුණුබුරා රහත් වෙලා, දුව රහත් භික්ෂුණින් වහන්සේ නමක්, තාත්තා අපායේ. බේරන්න බෑ. පුතා, දෙව්දත් තෙරුන් වහන්සේත් අපායට ගියා. දෙව්දත් තෙරුන් වහන්සේත් එක්ක කෝකාලිකාලා කට්ටිය එකතුවෙලා එක එක හර්තාල් දැම්මා. ඔක්කොම අවීචි මහා නරකයට ගියා. ඒ කියන්නේ තථාගතයන් වහන්සේ දේශනා කරපු ඒ සත්‍ය ධර්මය විකුර්ති කරලා වෙනස් කරලා ඉදිරිපත් කරපු නිසයි.

අපි කිව්වා නේද පුද්ගල සංඥාවක් එනවා, දිට්ඨිගත වෙනවා කියලා. එහෙම දිට්ඨිගත උනහම 'මම' කියලා පුද්ගලයෙක් කියලා මාන්නය ආවගම ඉන්න තැන පේන්නේ නෑ. එයා කැමති නෑ කවදාකවත් 2nd වෙන්න. එතකොට ගෝලයෙක් වෙනවා. ඒක නිසා හැමවෙලේම තමන්ගේ සිතට මතුවෙච්ච දේම තහවරු කරන්න තමයි මහන්සි ගන්නේ.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස එතකොට පුද්ගල සංඥාවට අමතරව වෙන මොනවද දිට්ඨිගත වෙන්න තිබෙන අවස්ථාවල්.

පිළිතුර - සත්ව පුද්ගල වශයෙන් ‘මමය’ ‘මගේ’ කියලා ගන්න ඔක්කෝම ඒකට අයිති වෙන්නේ.

ප්‍රශ්නය - එතකොට ස්වාමීන්වහන්ස සෝවාන් ඵලයේදී තමන් සත්වයෙක් පුද්ගලයෙක් කියන දෘෂ්ඨිය නැති වෙනවද?

පිළිතුර - ඒක තමයි නැති වෙන්නේ. ඒක වෙන්නේ මෙහෙමයි. මිනිස්සු දහ දෙනෙක් ඉන්නවා. එයින් එක්කෙනෙක් විදර්ශනා වඩනවා. ඒ දහ දෙනාටම ආත්ම සංඥා තිබෙනවා. ඒ දහ දෙනාම හිතාගෙන ඉන්නවා ‘මම’ පුද්ගලයෙක් සත්වයෙක් කියලා. ඒ දහ දෙනාම හිතනවා මම වගේම අනිත් දහ දෙනත් සත්වයෝ පුද්ගලයෝ කියලා. එතකොට ඒ දහ දෙනාටම තිබෙන්නේ එකම දෘෂ්ඨිය. එයින් එක්කෙනෙක් විපස්සනා වඩනවා. විදර්ශනා වඩන එක්කෙනාගේ හිතේ විදර්ශනාව වඩපු නිසා ‘සත්වයෙක් පුද්ගලයෙක් නෑ, ආත්මයක් නෑ’ කියන එක තහවරු වෙනවා. එතකොට තමන්ගේ ඇතුලෙත් සත්වයෙක් පුද්ගලයෙක් නෑ, අනිත් හැම දෙනා තුලත් සත්වයෝ පුද්ගලයෝ නෑ කියලා එයාට තේරෙන්නේ වැටහෙන්නේ අවබෝධ වෙන්නේ ඔක්කෝටම සාධාරණවයි. හැබැයි ඒ අවබෝධය ඇති වෙලා ඒ දෘෂ්ඨිය නැති උනේ එක්කෙනුකුගේ පමණයි. අනිත් නම දෙනාගේ දෘෂ්ඨිය තිබෙනවා.

ප්‍රශ්නය - එතකොට ස්වාමීන්වහන්ස කාම උපාදානය, දිට්ඨි උපාදානය, සීලබ්බත උපාදානය, අත්තවාද උපාදානය කියලා උපාදන සතරක් තිබෙනවා. එතකොට රහත්වෙනකම් අපි මොනවා හරි උපාදානය කරනවා. එතකොට සෝවාන් වෙනකොට ඒ උපදාන හතරෙන් දෙකක් නැතිවෙනවද?

පිළිතුර - මම මේක ලියලා කියලා දෙන්නම්.

1) සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත - අසංකාරික සිත
2) සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත - සසංකාරික සිත
3) සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත - අසංකාරික සිත
4) සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත - සසංකාරික සිත

5) උපේක්ඛා සගහත දිට්ඨිගත සම්පයුත්ත - අසංකාරික සිත
6) උපේක්ඛා සගහත දිට්ඨිගත සම්පයුත්ත - සසංකාරික සිත
7) උපේක්ඛා සගහත දිට්ඨිගත විප්පයුත්ත - අසංකාරික සිත
8) උපේක්ඛා සගහත දිට්ඨිගත විප්පයුත්ත - සසංකාරික සිත

} ලෝභ මූල සිත්

9) දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත - අසංකාරික
10) දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත - සසංකාරික

} දෝස මූල සිත්

11) උපේක්ඛා සහගත විචිකිච්චා සිත
12) උපේක්ඛා සහගත උද්ධච්ච සිත

} මෝහ මූල සිත්

දැන් හොඳට බලන්න මේ අකුසල් 12 න් තමයි මහා නරකයට යන්නේ. නරකාදියට ගෙනියන්න පුළුවන් මහා විසාල බලයක් මේ සිත්වල තිබෙනවා. ප්‍රේත ලෝකයට යන්න තිරිසන් ලෝකයට යන්න මනුස්ස ලෝකයේත් නොයෙක් ආකාරයේ අකුසල විපාක ප්‍රවෘත්ති වශයෙන් ගෙනත් දෙන්නේ මේ සිත්වලින්. නරකය තිරිසන් ප්‍රේත සමහර අසුර ලෝකවලට යන්නේ මෙන්න මේ සිත් වල හැදෙන්නා වූ අකුසල බලය නිසා.

කෙනෙක් සෝවාන් වෙනකොට මේ සිත් 12 න් සම්පූර්ණයෙන්ම සිත් 5 ක් නැතිවෙනවා. ඒ පහට සමානුපාතිකව තිබෙන අකුසල් තිබෙනවා නම් ඒවා ඔක්කොම delete වෙලා යනවා. ඒ කියන්නේ 1,2,5,6,11 කියන සිත් 5.

| | |
|---|---|
| 1) සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත - අසංකාරික සිත<br>2) සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත - සසංකාරික සිත<br>5) උපේක්ඛා සගහත දිට්ඨිගත සම්පයුත්ත - අසංකාරික සිත<br>6) උපේක්ඛා සගහත දිට්ඨිගත සම්පයුත්ත - සසංකාරික සිත<br>11) උපේක්ඛා සහගත විචිකිච්චා සිත | } සෝවාන් මාර්ගයෙන් සම්පූර්ණයෙන්ම නැතිවෙන සිත් |

තව එයාට සෝමනස්ස සහගත දිට්ඨිගත විප්පයුත්ත සසංකාරික අසංකාරික සිත් පහළ වෙනවා. උපේක්ඛා සගහත දිට්ඨිගත විප්පයුත්ත සසංකාරික අසංකාරික සිත් පහළ වෙනවා. දෝමනස්ස සිත් පහළ වෙනවා. උද්ධච්ච සහගත සිත් පහළ වෙනවා. මේ ඉතුරු වෙච්ච අකුසල් සිත්වල ආපය ගාමී ශක්තිය හැදෙන්නේ නෑ. මේ සිත්වලින් එයාට අපායට යන අකුසල් සිද්ධ වෙන්නේ නෑ. මේ සෝවාන් පුද්ගලයාට කාමරාගය ආදිය තිබුණාට පෘතක්ජන පුද්ගලයෙකුට තිබෙන තරම් විසාල බලයක් නෑ. එහෙම වෙන්නේ ඒ ඉතුරුවෙලා තිබෙන සිත් වල දිට්ඨිගත සම්පයුත්ත භාවයක් නැති නිසයි.

සෝවාන් වූ කෙනාගේ දිට්ඨි උපාදානයත් අත්තවාද උපාදානයත් සීලබ්බත උපාදානයත් නැතිවෙනවා. කාම උපාදනය තිබෙනවා. මාන්නය තිබෙනවා.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස පටිඝ සම්පයුත්ත සිත්වලින් කෙනෙකුට හානියක් කළොත් බලවත් අකුසලයක් සිද්ධ වෙන්නේ නැත්ද?

පිළිතුර - සෝවාන් වෙච්ච එක්කෙනෙක් ඔය වැඩේ කරන්නේ නෑ.

ආර්ය ධර්මයේ පිහිටලා ආර්ය ධර්මයේ ගමන් කරලා නියම විදියට බොජ්ඣංග ධර්ම වඩලා භාවනා කරලා සෝවාන් මාර්ග ඵල අවබෝධ කරගෙන සසර දුකින් මිදීයන එක හොඳයි. නමුත් ඒ අනුසාරයෙන් ඒ විදියයි කියාගෙන සෝවාන් වෙච්ච අයත් ඉන්නවා. ඒ අය ළඟට ගියහම ටිකක් කල්පනාවෙන් ඉන්න එක හොඳයි. සමහර අය සෝවාන් කියාගෙන ඉන්නවා නමුත් ඒ අයට 'ඔයා සෝවාන් නෑ' කියලා කියපු ගමන්ම තරහ යනවා.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස දිට්ඨිගත විප්පයුත්ත සිත ගැන පොඩ්ඩක් විස්තර කරලා දෙන්න.

පිළිතුර - දිට්ඨිගත සම්ප්පයුත්ත උනා කියනකොට සත්වයෙක් පුද්ගලයෙක් ඉන්නවා කියන හැඟීම නිෂ්පාදනය වෙනවා. දිට්ඨිගත විප්පයුත්ත කියලා කියන්නේ අකුසලයක් කරනකොට ඒක කරගෙන යනවා නමුත් සත්ව සංඥාව - පුද්ගල සංඥාව ඒකෙ නිර්මාණය වෙන්නේ නෑ.

දිට්ඨියයි මාන්නයයි කියලා ධර්මතා දෙකක් තිබෙනවා. ඒවා අකුසල්. දිට්ඨිය තිබෙන සිතක කවදාකවත් මාන්නය පහළ වෙන්නේ නෑ. මාන්නය පහළ වෙන්නේ දිට්ඨිගත විප්පයුත්ත සිත් වලයි. ඒක නිසා සෝවාන් වෙච්ච එක්කෙනාට මාන්නය තිබෙනවා. අනාගාමී වෙනකම්ම ඒක තිබෙනවා.

බුදුරජාණන්වහන්සේගේ කාලයේදීත් ගොඩක් අය බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිල්ලා 'මට මෙහෙම උනා' කියලා රහත් භාවය ප්‍රකාශ කරලා තිබෙනවා. බුදුරජාණන් වහන්සේ 'මහණ ඔබ එහෙම නෑ, ගිහිල්ලා ධර්මය හසුරුවන්න' කියලා ආපහු යවලා තිබෙනවා. සමහර වෙලාවට රහත් වෙලා හිටපු අය බුදුරජාණන්වහන්සේ ඉස්සරහට ඇවිල්ලා 'මම කෙලෙසුන් නැසුවා, මගේ කටයුතු ඉවරයි' කියලා ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ වෙලාවේදී බුදුරජාණන් වහන්සේ ඒක ඇත්තයි කියලා නිශ්ශබ්දතාවයෙන් පිළිඅරගෙන තිබෙනවා. තවත් සමහර අය ඒ කියන දේ ගැන බලාගෙන ඉඳලා ඒ විදියටම ඇවිල්ලා කියලා තිබෙනවා. ඒ වෙලාවේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තිබෙනවා 'නෑ ඔබ එහෙම නෑ තව කරන්න වැඩ තිබෙනවා' කියලා. සමහර අය ඉන්නවා බුදුරජාණන්වහන්සේට කියන්නෙත් නැතුව කාටවත් කියන්නෙත් නැතුව රහත් වෙලා පාඩුවේ ඉඳලා තිබෙනවා. එතකොට කවුරුවත් දන්නේ නෑ. සමහර වෙලාවට වෙන කෙනෙක් කියනවා පරෙස්සම් වෙන්න එයා හරි ගුණවන්ත කෙනෙක් කියලා. නමුත් ඒ කාලේ කව්රුවත් ඉඳලා නෑ 'මම දැන් රහත් වෙලා ඉන්නේ, මමත් එක්ක එකට එක කියාගෙන එන්න එපා, බලාගෙනයි' කියලා තරවටු කරපු අය.

ඒ විදියට රහත් ගුණය අඟවපු අය නිගණ්ඨයන් අතරනම් හිටියා. දැනුත් නිගණ්ඨයෝ ගොඩක් ඉන්නවා සැවැත්නුවර පැත්තෙත් ලක්නව් වලත්.

ඒ කාලයේ මෙහෙම දෙයක් උනා. බුදුරජාණන් වහන්සේ අවස්ථා කීපයකදී යමාමහ පෙළහරපෑවා. සැවැත්නුවර දී අසවල් තැනදී අඹ ගසක් මුල යමාමහ පෙළහර පානවා කියලා බුදුරජාණන්වහන්සේ නිවේදනයක් නිකුත් කළා. ඒ නිගණ්ඨයෝ කල්පනා කළා අඹගස් තිබුනොත් තමයි යමා මහා පෙළහැර පාන්නේ කියලා ඒක නොකරන්න ඒ පැත්තේ තිබුණ ඔක්කෝම අඹගස් ටික කැප්පෙව්වුවා.කොහොම හරි බුදුරජාණන්වහන්සේ උයන් පල්ලෙක් පූජා කරපු අඹ ගෙඩියක් වලදළා ඒ ඇටයෙන් ඒවෙලාවේම හටගත්ත ගහ යට ඉඳන් යමාමහ පෙළහර පෑවා. ඔය විදියට නිගණ්ඨයෝ හැම දෙයක්ම බොරු කරන්න තමයි හැදුවේ.

තවක් සිද්ධියක් උනා. රහත් භාවය check කරන්න ඒකාලයේ හිටපු ගිහි කෙනෙක් කරපු වැඩක් තිබෙනවා. පිණ්ඩෝලභාරද්වාජ මහරහතන් වහන්සේ හඳුන් පාත්තරයක් ගත්තා. ඒ කාලයේ සිටුවරයෙක් හිටියා, ඒ සිටු වරයා උස උණ ගස් ගෙනැල්ලා එකට තියලා උස උණ ගසක් හිටෙව්වා. ඒක උඩ හඳුන් පාත්තරයක් රුඳෙව්වා. අද කාලේ වගේම රහතන්වහන්සේ කියා කියා ඇවිදින අය ඒ කාලෙත් ඉඳලා තිබෙනවා. ඒවගේ ආජීවකයොත් හිටියා නිගණ්ඨයෝත් හිටියා හාමුදුරුවරුත් හිටියා. ඒ සිටුවරයා 'ඇත්තටම රහතන් වහන්සේලා ඉන්නවා නම් හඳුන් පාත්තරයක් තිබෙනවා, ඒක ගන්න කියලා' නිවේදනයක් නිකුත් කළා.

සමහර අය බොරුවට රහතන්වහන්සේලා කියලා හඳුන්වාගෙන හිටපු අය නිසා ඒ අයට යන්න එපා කියලා බය කරලා වලක්වා ගත්තා. ඒ අය ඒ විදියට රැකුණා. නිගණ්ඨයෝ ඒ ගොල්ලන්ගේ ලොක්කට කිව්වා 'රහත් භාවය ඔප්පු කරන්න ඔබතුමා ඔය කණුව උඩට පියාඹලා වගේ යන්න මහන්සි ගන්න, අපි ඇවිල්ලා ලීයකට මොකටද ඔයවගේ රහත් භාවයක් ප්‍රසිද්ධ කරන්නේ, ඒක නිසා ඕක කරන්න එපා' කියලා කකුලෙන් පහළට අදින්නම් කියලා. ඉතින් ඒ විදියට නිගණ්ඨ ලොක්කා නගින්න හදනකොට එපා එපා කියලා වැලැක්කුවා. ඒ අය ලැජ්ජාව වහ ගත්තේ ඔය විදියටයි. ඔය අතරේ පිණ්ඩෝලභාරද්වාජ හාමුදුරුවෝ උඩින් ගිහිල්ලා පාත්තරේ ගත්තා. ඉතින් ඔය වගේ test කරන ඒවා ඒ කාලෙත් තිබිලා තියෙනවා.

මේ ඔක්කොම දේවල් කරලා තිබෙන්නේ සැක හින්දයි. ඒ කියන්නේ ඇත්ත රහතන්වහන්සේලා හිටියා වගේම රහත් කියලා බොරුවට හිටපු අයත් ඉඳලා තිබෙනවා. සිවුරු දාගත්ත අයත් ඉඳලා තිබෙනව. ඉතින් දැන් කාලේ ඒවගේ අය ඉන්නවා කියන එක අරුමයකුත් නොවෙයි.

රහත් කියලා කිව්ව ගමන් ප්‍රතිලාභ හම්බ වෙනවා. මිනිස්සු පහදිනවා. ඒ කාලයට තිබෙන ප්‍රතිලාභ ලැබෙනවා. කීර්ති ප්‍රශංසා ලැබෙනවා. ඒකට තමයි ඒ කරන්නේ.

එක ආරාමය හාමුදුරුවෝ කෙනෙක් ඉඳලා තිබෙනවා. ඒ හාමුදුරුවෝ හිටපු ගමන් පේනවලු හිටපු ගමන් නැතිලු. දායකයා ඇතුලට ගිහිල්ලා බලනකොට නැතිලු. ඒ කුටියේ ලොකු තාලියක් තිබිලා තිබෙනවා. දායකය ඇතුලට එනකොට ඒ හාමුදුරුවෝ ඒක අස්සට රිංග ගන්නවලු.

ඒ පන්සල තිබිලා තියෙන්නේ කන්දක් උඩ. ඒ හාමුදුරුවෝ වඩම්මවාගෙන යන්න දායකයෝ ආවහම ඒ හාමුදුරුවෝ දායකයට කියනවලු 'ඉස්සෙල්ලා යන්න මම පස්සේ එන්නම්' කියලා. ඒ යන පාරේ තිබිලා තිබෙනවා නුග ගහක්. ඒ සවාමීන්වහන්සේ කරන්නේ දායකයට පාර දිගේ යන්න ඇරලා පාත්තරෙත් අරගෙන ඒ නුග ගහේ වැලක එල්ලිලා පල්ලෙහාට බැහැලා දායකයට ඉස්සෙල්ලා යනවලු. දායකයා මේ ගැන පුදුමයට පත් වෙලා ඇහුවහම 'ඒ ගැන කථා කරන්න එපා' කියලා අමුතු හැඟීමක් ඇතිවන විදියට කියනවා. නමුත් දායකයට ඒ ගැන හොඳ කල්පනාවක් ඇති උනා. දායකයා කල්පනා කළා කොහොමද ඒක වෙන්නේ කියලා. මේ වගේ කීප ගමනක්ම වෙන කොට දායකයා හැංගිලා බලාගෙන හිටියා. බලාගෙන ඉඳලා ඒ දායකයා හාමුදුරුවෝ පහළට බහින වැල කපලා නොපෙනන විදියට යම්තම් එකතු කරලා තිබ්බා. පහුවදාත් 'දායක මහත්තයා යන්න මම පස්සේ එන්නම්' කියලා ඒ සවාමීන්වහන්සේ පාත්තරේ අරගෙන ඒ වැලේ එල්ලෙන ගමන් ඒක කඩාගෙන පහළට වැටුනා. ඊට පස්සේ ඒ ජනප්‍රියත්වය නැති උනා. ඔය වගේ වැඩ ඒ දවස්වලත් කළා.

රහත් භාවය කියන එක කිලෝ ගානට මීටර් ගානට යාර ගානට තිබෙන එකක් නොවෙයි. රහත් භාවය කියන්නේ ගුණයක්. ඒක quality එකක්. එහෙම ගුණයක් තිබෙනවා නම් ඒක එළියට පේනවා. ඒ ගුණය නැති උනහම එකත් පේනවා. මනුස්සයකුගේ ජීවිතියේ කයෙන් හැසිරෙන හැසිරීමයි, වාචසික හැසිරීමයි, වාචසික පද ගැලපීමයි ඇතුලේ තිබෙනවා එයාගේ හිතේ තිබෙන්නා වූ දේ. ඒකට කියනවා 'අපදාන සෝභිනි පඤ්ඤා' කියලා. චරිතය කියන්නේ කයෙහි හැසිරීම සහ වචනයේ හැසිරීම. ඒකෙන් තේරෙනවා එයාගේ මනස කොහොමද වැඩ කරන්නේ කියලා.

මනසේ තිබෙනවා නම් උද්ධච්චයක් තරහක් මානයක් ඒ ටික වචන වලින් ගලාගෙන එනවා. ආයිත් මනින්න දෙයක් නෑ. අසූචි ගොඩක් තිබෙනවානම් ඒක ළඟටම යන්න ඕනෑ නෑ ඒක අසූචි කියලා දැනගන්න. ඒ ගඳ දුරක හිටියත් දැනෙනවා. ඒක තේරුම් ගන්න බැරි අය තමයි රැවටෙන්නේ. ටිකක් කථා කරලා බැලුවහම, ඒ කරන වැඩ ගැන බැලුවහම දැනෙනවා මේ අය රහතුන්ද කවුද කියලා. **අල්පේච්ඡතාවය, ලෝකයෙන් බැහැර වෙච්ච ගතිය, ගිහි සවරූපයෙන් අයින් වෙච්ච ගතිය, නියම වශයෙන් ශ්‍රමණ ධර්මයේ පිහිටපු ගතිය, කථාව ආදී දේ තුල තිබෙනවා රහතන්වහන්සේගේ ගුණය.** ඒ ගුණය තේරුම් ගන්නවා හැර වෙන විදියකට තේරුම් ගන්න බෑ. ඒවගේ ගුණයක් තිබෙනවා කියලා තේරුම් ගන්නත් කෙනෙකුට දැනුමක් තිබෙන්න ඕනෑ. අර මනුස්සයට වැඩි දැනුමක් තිබුණේ නැතත් වැල කපලා හරි බලන්න ඕන කියලා හිතුනා.

<u>ප්‍රශ්නය</u> - අපේ බුදුහාමුදුරුවෝ බෝධිසත්ව කාලේ ජෝතිපාල මානවක වශයෙන් කාශ්‍යප බුදුහාමුදුරුවන්ට අපහාස කළා නේද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - මෙන්න මෙහෙම එකක් තිබෙනවා. නිවන් දක්නා තෙක්ම කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ලැබෙන්න ඕන කියලා කියන්නේ ඕකයි. සමහර අය ඉන්නවා ජීවිතියේ හැටියට මව්පියෝ උනාට අසත්පුරුෂයි. ඒ අසත්පුරුෂ අම්මලා තාත්තලාට කොටු උනොත් එහෙම පොඩි කාලේ ඉඳලාම කියලා දෙන්නේ අසත්පුරුෂ වැඩ. ජෝතිපාල මානවකට බමුණු කුලයක ඉපදිලා පොඩි කාලේ ඉඳලාම හැම වෙලේම කියලා දුන්නේ මුඩුමහණුන්ට රහත් භාවය නෑ කියලා. දෘෂ්ඨියෙන් ගිල ගත්ත එකක් එතැනදී බෝධිසත්වන් වහන්සේට තිබුණේ. ජෝතිපාල මානවකට හිටියා ඝටීකාර කියලා සත්පුරුෂයෙක්. ඒ සත්පුරුෂ යාලුවා නිසා තමයි ජෝතිපාල මානවකයාට ඒකෙන් මිදෙන්න පුළුවන්කම තිබුණේ. ඒක නිසා අසත්පුරුෂ ආශ්‍රය කියන එක ඒ තරම්ම භයානකයි. අසත් පුරුෂ ආශ්‍රය කියලා කියන්නේ හරිම භායනක එකක්.

බුදුරජාණන්වහන්සේ අජාසත්ත රජතුමාට සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කරලා රජතුමා නැගිට්ලා යනකොට භික්ෂුන් වහන්සේලාට කිව්වා ‘‘තාත්තා මරන්නේ නැතුව හිටියා නම් ඒ ආසනයේදීම රජතුමා සෝවාන් වෙනවා, ධර්මය අවබෝධකර ගන්නවා’’ කියලා.

හොඳයි එහෙනම් හැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.